සාමාන්‍ය සමය දසවන ඉරුදින **දේව ප්‍රකාශන** 10-06-12

## පළමුවන කියැවීම

උත්පත්ති 3:9-15

උත්පත්ති කථාවෙන් ගත් පාඨයකි.

"තගේ වංශය හා ඇගේ වංශය අතර බද්ධ වෛරය තබන්නෙමි."

එහෙත් දෙවි සමිඳුණන් වහන්සේ මිනිසාට හඬ ගසමින් "නුඹ කොහේද" යි ඇසූ සේක. "ඔබ වහන්සේගේ කටහඬ උයනේ මට ඇසිණි. එහෙත් මා නග්න බැවින් බිය වී සැඟවුණෙමි"යි ඔහු උත්තර දුන්නේ ය. එවිට උන්වහන්සේ "නුඹ නග්න බව කීවේ කවරෙක් ද? මා නුඹට තහනම් කළ ගසින් නුඹ ගෙඩි කෑවෙහිද"යි ඇසූ සේක, ඔහුද පිළිතුරු දෙමින්, "ඔබ මට සහකාරිය වශයෙන් දුන් ස්ත්‍රිය ඒ ගසේ ගෙඩි කඩා මට දුන්නාය, මමත් කෑවෙමි"යි පැවසී ය. එවිට දෙවි සමිඳුණන් වහන්සේ ස්ත්‍රියට කතා කොට "නුඹ මෙය කළේ මන්ද"යි ඇසූ සේක, "සර්පයා මා රැවටී ය. මමත් කෑවෙමි"යි ඇ පිළිතුරු දුන්නාය, එවිට දෙවි සමිඳුණන් වහන්සේ සර්පයාට කතා කොට මෙසේ වදාළ සේක. "තා මෙය කළ බැවින් සියලු ගව මහීෂයන්ට ද වනයේ සියලු මෘගයන්ට ද වඩා තෝ සාප ලද්දෙක් වේවා! දිවි ඇති තාක් උරගා යමින් තෝ දූවිලි කන්නෙහි ය. තා හා ස්ත්‍රිය අතරේ ද තගේ වංශය සහ ඇගේ වංශය අතරේ ද බද්ධ වෛරය තබන්නෙමි. ඔහු තගේ හිස පොඩි කරන්නේ ය. තෝ ද ඔහුගේ විලුඹ දෂ්ඨ කරන්නෙහි ය." දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 130:1-8

පිළිතුරු: සමිඳුණන්ගේ ප්‍රේමය තිරසාර ය. ගැළවීම මුළුමනින් එතුමන් අතෙහි ය.

ගීය: සමිඳුනි, දුක් සයුරේ සිට මම ඔබට මොර ගසමි, සමිඳුනි, මාගේ හඬට සවන් දුන මැනව. මාගේ කන්නලව්වට ඔබේ කන් යොමු කළ මැනව. සමිඳුනි, ඔබ අපේ අයුතුකම් සටහන් කර තබන සේක් නම් විනිශ්චයෙන් බේරෙන්නට පුළුවන් කවරෙකුට ද?

එහෙත් ඔබ කෙරෙහි ගරු බියෙන් සිටින පිණිස ඔබ අපට කමාව දෙන සේක. මම සමිඳුන්ගේ උපකාරය උදක්ම බලා සිටිමි. එතුමන්ගේ වචනය කෙරෙහි බලාපොරොත්තුව තබමි. පහන් වන තුරු බලා සිටින මුරකරුන්ට වඩා, එසේය, එළිය වැටෙන තුරු බලා සිටින මුරකරුන්ට වඩා මම සමිඳුන් එනතුරු බලා සිටිමි.

එම්බා ඉශ්රායෙල් ජනයෙනි! සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න. මන්ද, සමිඳුන්ගේ ප්‍රේමය තිරසර ය. ගැළවීම මුළුමනින් එතුමන් අතෙහි ය. එතුමාණෝ ඉශ්රායෙල් ජනයා ඔවුන්ගේ පාප සියල්ලෙන් මුදා හරින සේක.

## දෙවන කියැවීම

2කොරින්ති 4:13-5:1

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් කොරින්තවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

ඇදහිල්ල ඇති අපිත් විශ්වාස කරන නිසා කතා කරමු.

තවද "මම විශ්වාස කළ නිසා කතා කළෙමි"යි ශුද්ධ ලියවිල්ල කියයි. එම ඇදහිල්ල ඇති අපිත් විශ්වාස කරන නිසා කතා කරමු. ස්වාමීන් වන ජේසුස් වහන්සේ උත්ථාන කළ දෙවියන් වහන්සේ, ජේසුස් වහන්සේ සමග අපත් උත්ථාන කරන බවද ඔබ සමග අපත් උන්වහන්සේ ඉදිරියට පමුණුවන බවද අපි දනිමු. මේ සියල්ල ඔබ උදෙසා සලසා ඇත්තේ දේව වරප්‍රසාදය බොහෝ දෙනෙකු වෙත පැතිරී වැඩි වී යාමෙන් දෙවියන් වහන්සේගේ මහිමය සඳහා ස්තුති දීම ද අධික වන පිණිස ය. එබැවින් අපි අධෛර්ය නොවෙමු.

බාහිර වශයෙන් අප දිරාපත් වෙමින් සිටියත්, අභ්‍යන්තරික වශයෙන් අපි දිනෙන් දිනම අළුත් වෙමින් පවතිමු. දැනට අප විඳින තාවකාලික සුළු දුක, එය මුළුමනින් ම ඉක්මවා යන සදාතන තේජස් සම්භාරයකට මග පාදයි. මන්ද, අප නෙත් යොමු කර සිටින්නේ දෘශ්‍යමාන දේ දෙස නොව අදෘශ්‍යමාන දේ දෙස ය. දෘශ්‍යමාන දේ තාවකාලිකය. අදෘශ්‍යමාන දේ සදාකාලිකය. කූඩාරමක් වැනි අපගේ භෞමික නිවාසය ගරා වැටුණත් දෙවියන් වහන්සේගෙන් වන, අතින් නොතැනූ, සදාකාලික නිවාසයක් ස්වර්ගයෙහි අපට ඇති බව අපි දනිමු. දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

ජුවාම් 14:23

ආලේලූයා! ආලේලූයා!
"යමෙක් මට ප්‍රේම කරන්නේ නම්, හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේය.
මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක.
අපි ඔහු වෙතට පැමිණ ඔහු සමග වාසය කරන්නෙමු."යි ස්වාමින් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 3:20-35

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**ශුද්ධාත්මයාණන්ට අපහාස කරන කිසිවෙකුට කවර කලක වත් කමාවක් නැත්තේ ය.**

ජේසුස් වහන්සේ ගෙදර ගිය සේක. ඔවුන්ට කෑම කන්න වත් අවකාශ නැති වන තරමට සමූහයක් යළිත් රැස් වූ හ. උන් වහන්සේගේ නෑදෑයෝ ඒ අසා උන් වහන්සේ අල්ලා ගැනීමට ගියහ. එසේ ගියේ, "උන් වහන්සේ සිහිවිකල් වී සිටිති" යි සමහරුන් කී බැවිනි. ජෙරුසලමෙන් ආ විනයධරයෝ, "මොහුට බෙල්සෙබුල් ආවේශ වී ඇතැ යි"ද, "දුෂ්ටාත්මාධි පති බලයෙන් ඔහු දුෂ්ටාත්මයන් දුරු කරති" යි ද කී හ. එවිට උන් වහන්සේ ඔවුන් තමන් වෙත කැඳවා, උපමාවලින් කතා කරමින් මෙසේ වදාළ සේක: "සාතන් දුරු කරන්න සාතන්ට ම පුළුවන් ද? යම් රාජ්‍යයක් ඊට ම විරෝධී ව භේද වුවහොත්, ඒ රාජ්‍යයට පවතින්න නොහැකි ය. යම් ගෙදරක් ඊට ම විරෝධී ව භේද වුවහොත්, ඒ ගෙදරට පැවැත්මක් නැත්තේ ම ය. සාතන් තමාට ම විරෝධී ව නැඟී භේද වුවහොත්, ඔහුට පැවැත්මක් නැත. එය අවසානය වේ. එහෙත්, බලවතෙකු පළමුකොට බැඳදමා මිස, ඔහුගේ ගෙට වැද බඩු කොල්ලකන්න කිසිවෙකුට නොහැකිය. ඔහුගේ ගෙය කොල්ලකන්න හැකි වන්නේ, එසේ කළොත් පමණකි. "සැබැවින් ම මම ඔබට කියමි, මිනිසුන්ගේ සෑම පාපයන් ද සියලු ආකාර දේව අපහාසයන් ද කමා කරනු ලබන්නේ ය. එහෙත්, ශුද්ධාත්මයාණන්ට අපහාස කරන කිසිවෙකුට කවර කලක වත් කමාවක් නැත්තේ ය. ඔහු සදාතන පාපයක් ගැන වරදකරුවෙකි." මෙසේ වදාළේ, "උන් වහන්සේට අශුද්ධාත්මයක් වැහී ඇතැ"යි ඔවුන් පැවසූ බැවිනි. එවිට උන් වහන්සේගේ මෑණියෝ ද සහෝදරයෝ ද අවුත් පිටත සිට, උන් වහන්සේ කැඳවා පණිවුඩයක් යැවූ හ. සමූහයක් උන් වහන්සේ අවට වාඩි වී උන්හ. ඔව්හු, "අන්න, ඔබේ මෑණියෝත්, සහෝදරයෝත්, සහෝදරියෝත් පිටත සිට ඔබ සොයති"යි උන්වහන්සේට කීහ. උන් වහන්සේ උත්තර දෙමින්, "මාගේ මෑණියෝත්, මාගේ සහෝදරයෝත් කවුරු ද" කියා පෙන්වමින්, තමන් පිරිවරා අවට වාඩි වී සිටියවුන් දෙස වටේට බලා, "මෙන්න මාගේ මෑණියෝ, මෙන්න මාගේ සහෝදරයෝ ! දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන කවරෙක් හෝ වෙත් වා, ඔව්හු මාගේ සහෝදරයාත්, මාගේ සහෝදරීත්, මාගේ මෑණියෝත් ය"යි වදාළ සේක. සුවිශේෂ වාක්‍යය එසේ ය.